පොදු චක්‍රලේඛ අංක :- 01/2020

මගේ අංකය- දපස/සමු.සං/සං/18
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත,ගාල්ල.
2020.11. 30

දකුණු පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ගරු සභාපති/ සාමාන්‍යාධිකාරි/ලේකම් .

**<u>සමුපකාර සමිති සඳහා විගණන කමිටු ස්ථාපිත කිරීම.</u>**

විවිධ සේවා සමුපකාර සමිති විසින් ගිණුම් පවත්වා ගෙන යාම, අවසාන ගිණුම් සකස් කිරීම හා විගණනය සඳහා ගිණුම් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම මෙන්ම එම ක්‍රියාවලිය අඛණ්ඩව නීතියෙන් නියම කර ඇති ක්‍රමවේදය අනුව සිදු වන්නේද යන්න මෙන්ම වැරදි/ වංචා/අක්‍රමිකතා අනාවරනය කර ගැනීම හා එවැනි සිදුවීම් වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීම කාලීන අවශ්‍යතාවයක් බව පෙනී ගොස් ඇත.

02. විවිධ පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරණ සමුපකාර සමිති පනතේ 43අ.(1) වගන්ති ප්‍රකාරව සමහර සමුපකාර සමිති, තම සමිතියේ ආදායම් හා වියදම් සහ වත්කම් හා බැරකම් පිළිබඳ නිසි ගිණුම් පවත්වා ගෙන නොයාම මෙන්ම උක්ත පනතේ 43අ.(2) වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී මාස තුනක් ඇතුළත සමිතියේ කටයුතු වලට අදාල ගිණුම් හා සංඛ්‍යාන පිළිබඳ වාර්ෂික ප්‍රකාශණයන් ඉදිරිපත් නොකිරීම විගණන කටයුතු යාවත්කාලීනව සිදු නොවීම කෙරෙහි මූලික ලෙස බලපා ඇති බවත්, එය සමුපකාර සමිති තුළ සිදු වන වැරදි/ වංචා/අක්‍රමිකතා කඩිනමින් අනාවරණය කර ගැනීමට බාධාවක් වී ඇති බවත් අනාවරණය වී ඇත.

03. මේ සම්බන්ධව ජාතික මට්ටමින් පවත්වන පළාත් සමුපකාර කොමසාරිස් සමුළුවලදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් පසු ඒ ඒ සමුපකාර සමිතිවල විගණන කටයුතු යාවත්කාලීන කිරීම සඳහා සමුපකාර සමිති මට්ටමෙන් විගණන කමිටුවක් ස්ථාපිත කිරීමට යෝජනා වූ අතර ඒ තුළින් සමුපකාර සමිතිවල මූල්‍ය කළමණාකරණය හා අනෙකුත් පරිපාලන කටයතු නෛතික රාමුව තුල පවත්වාගෙන යාමත්, ඒතුලින් ආයතනයේ මූල්‍ය විචක්ෂණභාවය හා මූල්‍ය කළමණාකරණය වැඩිදියුණු කිරීම මඟින් වඩාත් සඵලදායී සේවාවක් ලබා දීමත් අපේක්ෂා කෙරේ.

04. මේ අනුව දකුණු පළාත තුල ලියාපදිංචි කර ඇති සියළුම සමුපකාර සමිති වල විගණන කමිටු පත් කර ගැනීම කාලීන අවශ්‍යතාවයක් බැවින් කඩිනමින් තම සමිතිය සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විගණන කමිටුවක් ස්ථාපිත කර ගැනීමට මෙයින් උපදෙස් ලබා දෙමි.

05. විගණන කළමණාකරණ කමිටුවේ සංයුතිය.

- අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙක්,
- සාමාන්‍යාධිකාරී,
- ගණකාධිකාරී,

- ➢ අභ්‍යන්තර විගණක
- ➢ පොත්තබන්නා.

06. විගණන කමිටුවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම හා සම්බන්ධිකරණ කටයුතු එකී කමිටුව සඳහා නම් කරනු ලබන අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයා විසින් සිදු කල යුතු අතර එකී කටයුතු නිසි පරිදි සිදු වන්නේ දැයි අධීක්ෂණය කිරීම සමිතියේ ගරු සභාපතිවරයගේ වගකීමක් වන්නේය.

07. තවද මෙම කමිටුව සඳහා සමිතිය භාර සමුපකාර සංවර්ධන නිලධාරීගේ සහාය ලබා ගැනීමට කටයුතු කල යුතු අතර, කමිටුව මාස දෙකකට වරක්වත් කැඳවිය යුතු වේ. තවද මෙම කමිටුවේදී අනාවරණය වන කරුණු හා ඒ පිළිබඳ කමිටු නිර්දේශ, ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධව කමිටුව රැස්වූ මාසය තුලම අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කල යුතු අතර එහි වගකීම ගණකාධිකාරීවරයා සතුවේ.

08. ඉහත පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය ඒ සම්බන්ධයෙන් ගනු ලබන තීරණ සමිතියේ අදාල නිලධාරීන් වෙත දැනුම් දී ක්‍රියාත්මක කිරීම මෙන්ම ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කිරීම සමිතියේ ගණකාධිකාරීවරයා විසින් සිදු කල යුතු වේ.

විගනණ කමිටුයේ කාර්යන්.

- ➢ ආදායම් හා වියදම් සහ වත්කම් හා බැරකම් පිළිබඳ නිසි ගිණුම් පවත්වා ගෙන යාම සහතික කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම, ඒ සඳහා සුදුසු නිලධාරීන් යෙදවීම හා එම කටයුතු සමාලෝචනය කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.
- ➢ මුදල් වර්ෂය අවස්වී මාස තුනක් ඇතුලත වාර්ෂික විගණනය සඳහා අදාල අවසාන ගිණුම් දිස්ත්‍රික් සහකාර කොමසාරිස් වෙත ලබා දීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම හා ඊට අදාල සුදුසු යාන්ත්‍රණයක් සකස් කර ගැනීම
- ➢ අභ්‍යන්තර විගණකගේ වාර්තා සමාලෝචනය කර පෙන්වා දී ඇති ඌණතා පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම හා ඒ පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කිරීම.
- ➢ වාර්ෂික විගණන සැලස්ම සකස් කිරීම හා සැලස්මේ සඳහන් ආකාරයට අදාල කටයුතු සිදු කිරීම හා සැලස්මේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කිරීම.
- ➢ ගිණුමකරණ ප්‍රමිතීන් අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා සමාලෝචනය කිරීම.
- ➢ වාර්ෂික විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග කඩිනමින් ගැනීම හා/හෝ ඊට අදාල නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීම.
- ➢ සමුපකාර පනත, සමුපකාර රීති, කොමිෂන් සභා ප්‍රඥප්තිය ,එහි නියෝග ,ඡන්ද ගැසට් පත්‍රය, සමිතියේ අතුරු ව්‍යවස්ථාව ,සමුපකාර දෙපාර්තමේන්තුව හා සමුපකාර සේවක කොමිෂන් සභා හා වෙනත් අනුබද්ධිත ආයතන වල චක්‍රලේඛ/ උපදෙස් පත්‍රිකා පිළිබඳ දැනුවත් වීම හා ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යාන්ත්‍රණය සකස් කිරීම හා/හෝ ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යාන්ත්‍රණයක් සකස් කිරීමට අවශ්‍ය වන නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීම.

- සමිතිය සතු මානව හා භෞතික සම්පත් සඵලදායීව යොදා ගැනීමට අවශ්‍ය නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරිම හා ඒ කටයුතු සමාලෝචනය කිරීම.
- සමිතියේ එක් එක් අංශවල කටයුතු නිසි පරිදි පවත්වා ගෙන යාමට හා අධීක්ෂණයට අදාල වන නිර්ණායක සකස් කර අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරිම.
- මූල්‍ය වංචා හෝ අක්‍රමිකතා අනාවරණය වී ඇති අවස්ථාවක, එවන් මූල්‍ය වංචාවක් හෝ අක්‍රමිකතාවයක් තවදුරටත් සිදු වීම වළක්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධයන් වන නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීම.

09. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කරමින් තම සමිතියේ කටයුතු නිසි පරිදි පවත්වා ගෙන යාමට කටයුතු කරන ලෙසත්, විගණන කමිටුව පත් කිරිම හා එහි කටයුතු පවත්වා ගෙන යාම සම්බන්ධ ප්‍රගතිය මාස තුනකට වරක් මා වෙත වාර්තා කරන ලෙසත් වැඩිදුරටත් මෙයින් උපදෙස් ලබා දෙමි.

ආර්.ජී. කන්නන්ගර
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්
දකුණු පළාත් සමුපකාර දෙපාර්තමේන්තුවේ
දකුණු පළාත.

ආර්. ජී. කන්නන්ගර
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත.

පිටපත:- සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්(ගාල්ල/මාතර/හම්බන්තොට)- දැ.පි.හා සියළුම සමිති භාර නිලධාරින් දැනුවත් කිරීම සඳහා